# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,393 - 2024 ජූලි මස 12 වැනි සිකුරාදා - 2024.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1836 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1849 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අගෝස්තු මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1833- B 82586 — 5,403 (2024/07)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2024 වර්ෂය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පුරප්පාඩුව පවතින නීති නිලධාරි තනතුර එකක් සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :-* රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් තෝරාගෙන පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබාදීමේ පටිපාටියට (අංක 07 යටතේ සඳහන් කොට ඇති) අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) **අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) **පළපුරුද්ද :**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු අදාළ තනතුරේ වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලසීමාව, දිනය හා නිලමුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.)

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයට අදාළ තනතුරක* වසර තුනකට (03) නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

(මෙම කරුණු ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

***සටහන*** : මූලික සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින් ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. **සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිලි ව සඳහන් නොවන හා සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරු වේ.)

(iii) **කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙ හි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) ***වෙනත් සුදුසුකම් :***

- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- පරිගණක සාක්ෂරතාවයෙන් යුක්ත විය යුතු අතර විද්‍යුත් තැපෑල හා Ms-Office ඵලදායීව භාවිතා කිරීමට හැකිවිය යුතුය.
- මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දිනට ඉහත සඳහන් සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසිඃ*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. *වයස් සීමාව* :- ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. ***වැටුප් පරිමාණය*** :- අංක 03/2016 හා 2016.02.25 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (SL -1-2016) මාසික වැටුප් පරිමාණයක් හිමි ය.

6. තනතුරට අදාළ කාර්යයන් :

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා තීන්දු/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය/මානව හිමිකම් කොමිෂන් සභාව/අභියාචනාධිකරණය/ශ්‍රේෂ්ඨාධිකරණය/මහජන පෙත්සම් කාරක සභාව/අනෙකුත් පාර්ලිමේන්තු කාරක සභා/රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ඔම්බුඩ්ස්මන් වෙත සහ අනෙකුත් ආයතන වෙත ඉදිරිපත්වන පැමිණිලි වෙනුවෙන් කොමිෂන් සභාවේ ස්ථාවරය පැහැදිලි කරමින් අදාළ පරිදි පෙනී සිටීම/නියෝජනය කිරීම.

ii. නීති කෘත්‍යන්ට අදාළ සියලුම වාර්තා සකස් කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම.

iii. නීති කෘත්‍යන්ට අදාළ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කිරීම.

iv. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් අදාළ වාර්තා සැකසීම/එම කොමිෂන් සභාව විසින් කරනු ලබන කැඳවීම්වල දී අදාළ තොරතුරු සමග පෙනී සිටීම.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් ගරු නීතිපතිතුමා පෙනී නොසිටින නඩුවල දී අදාළ අධිකරණය ඉදිරියේ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීම.

vi. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි කටයුතු.

6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේඃ

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | |
| | ***සටහන* - ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.** | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය; | 12 | |
| | (ආ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 11 | 15 |
| | (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 10 | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද;<br>● පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය<br>● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය<br>● පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය<br>● සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය<br>(ඉ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය<br>(සටහන - නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 06 ලබාදෙනු ලැබේ.)</td><td><br><br>06<br>05<br>04<br>02<br>06<br>04</td><td></td></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද :<br>නඩුවලට අදළ ලේඛන සකස් කිරීම හා විවෘත අධිකරණයේ කරුණු දැක්වීම
<table>
<tr><th></th><th>අධිකරණය ඉදිරියේ නඩු ගොනු කිරීම් සඳහා උපරිම ලකුණු (එක් නඩුවක් සඳහා 0.5ක්)</th><th>අධිකරණය ඉදිරියේ පෙනීසිටීම් සඳහා උපරිම ලකුණු (එක් නඩුවක් සඳහා 0.5ක්)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>06</td><td>06</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>05</td><td>05</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>03</td><td>04</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>05</td><td>05</td></tr>
<tr><td>විනිශ්චයසභා (AAT)</td><td>05</td><td>06</td></tr>
<tr><td>මානව හිමිකම් කො.ස./විනිශ්චයසභා (LT)</td><td>02</td><td>03</td></tr>
</table>
සටහන : ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන්වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික කළ පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.</td><td></td><td>55</td></tr>
<tr><td>03.</td><td>භාෂා හැකියාව :<br>(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ)<br>(I) සන්ධාන භාෂාව<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය<br>(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවල දී (Moot Court Competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව.<br>කේවල<br>(i.) ප්‍රථම ස්ථානය /හොඳම කුසලතාවය - 03<br>(ii.) දෙවන ස්ථානය - 02<br>(iii.) තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 01<br>කණ්ඩායම්<br>(i.) ප්‍රථම ස්ථානය /හොඳම කුසලතාවය - 03<br>(ii.) දෙවන ස්ථානය - 02<br>(iii.) තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 01</td><td>04<br><br>03</td><td>10</td></tr>
</table>

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක් | 03 | |
| | (ඈ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසාන දිනට පූර්වාසන්න වසර 02 තුළදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ Edexel හෝ Cambridge හෝ IELTS සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ TOEFL - IBT 79 හෝ ඊට ඉහළ TOFEL - CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලකුණු ලබා තිබීම | 02 | |
| | (ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් | 01 | |
| | **(II) අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ)** | | |
| | (අ) රජයේ ලියාපදිංචි ආයතනයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (කාල සීමාව මාස 06කට/පැය 720කට නොඅඩු) | 06 | |
| | (ආ) රජයේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් (කාල සීමාව මාස 03කට/පැය 360කට නොඅඩු) | 05 | |
| | (ඇ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) සිංහල හා දෙමළ භාෂාව පළමු භාෂාව වශයෙන් සමත්වීම (භාෂා දෙකෙහිම අවම ශ්‍රේණිය සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| | විශිෂ්ඨ සම්මාන | 05 | |
| | අධි සම්මාන | 04 | |
| | සම්මාන | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථ | 02 | |
| | (ඈ) අ.පො.ස. (සා.පෙල) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) සිංහල හෝ දෙමළ දෙවන භාෂාව වශයෙන් සමත්වීම | | |
| | අධි සම්මාන | 02 | |
| | සාමාන්‍ය සාමාර්ථ | 01 | |
| 04. | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව** | | 20 |
| | වෘත්තීය හා එහි ආචාරධර්ම පිළිබඳ ආකල්ප | 04 | |
| | නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවනතා පිළිබඳ දැනුම (පරිපාලන නීතිය, මානව හිමිකම් නීතිය, ව්‍යවස්ථා නීතිය, සාක්ෂි නීතිය පිළිබඳව විශේෂ අවධාරණය සහිතව) | 10 | |
| | ව්‍යක්තබව හා තර්කානුකූලව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 06 | |
| | මුළු එකතුව | | 100 |

**08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

i. අයදුම්පත් **2024.08.15** වැනි දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 1200/9 රජමල්වත්ත පාර, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට 07 දක්වාත් තෙවැනි පිටුව අංක 08 සිට 11 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු. 47,615ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රතික්ෂේප වීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**10. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ජූලි මස 02 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

***නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2024***

(අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4 ☐

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යොදන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : :————.

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : (2024.08.15)

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 දුරකථන අංකය : ස්ථාවර :————.

ජංගම :————.

3.5 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

04. අධ්‍යාපන සුදුසුකම් :

උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙක් වශයෙන් දිවුරුම් දීමට අදාළ වූ සහතිකය පිළිබඳ විස්තර :

I. එය පිරිනැමූ දිනය :————.
II. විශ්වවිද්‍යාලය හෝ ආයතනය :————.
III. උපාධියේ හෝ අධ්‍යාපන සහතිකයේ නම :————.
IV. උපාධිය හෝ අධ්‍යාපන සහතිකය වලංගු වන දිනය :————.
V. පන්තිය :————.
VI. උපාධිය හැදෑරූ මාධ්‍යය :————.

05. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| පාඨමාලාව | ලබාගත් ආයතනය | සුදුසුකම/සහතිකය වලංගුවන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

06. නීති ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :

| | අධිකරණය ඉදිරියේ නඩු ගොනු කිරීම් සංඛ්‍යාව | අධිකරණය ඉදිරියේ පෙනීසිටීම් සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | | |
| අභියාචනාධිකරණය | | |
| මහාධිකරණය | | |
| දිස්ත්‍රික් උසාවි | | |
| විනිශ්චය සභා (AAT) | | |
| මානව හිමිකම් කො. සභාව/ විනිශ්චය සභා (LT) | | |

7.1 භාෂා හැකියාව

| | කථනය | | | ලිවීම | | | කියවීම | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉතා හොඳයි | හොඳයි | දුර්වලයි | ඉතා හොඳයි | හොඳයි | දුර්වලයි | ඉතා හොඳයි | හොඳයි | දුර්වලයි |
| සිංහල | | | | | | | | | |
| දෙමළ | | | | | | | | | |
| ඉංග්‍රීසි | | | | | | | | | |

7.2 සන්ධාන භාෂාව හා අනෙක් රාජ්‍ය භාෂාව (සිංහල/දෙමළ) සම්බන්ධයෙන් හදාරා ඇති පාඨමාලා විස්තර (උපාධි/ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා)

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

08. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න. ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

---

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :————. ————,
අයදුම්කරුගේ අත්සන.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................... මයා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව මම සහතික කරමි.

දිනය :————. ————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම:————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය)

11. දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

දිනය :————. ————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය)

07-376

## අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### කම්කරු විනිශ්වය සහා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්වය සහා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම -2024

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්වයාධිකාරයන් හි පුරප්පාඩුව පවතින **සහකාර ලේකම් තනතුරු 20 ක්** සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලන ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, කම්කරු විනිශ්වය සහා ලේකම් කාර්යාලය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ "කම්කරු විනිශ්වය සහා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්වය සහා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් බාර ගන්නා අවසාන දිනය **2024.08.12 දින වේ.**

අයදුම්පත් යොමු කළ හැක්කේ ඒකාබද්ධ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නිලධාරීන්ට පමණි.

***සටහන*** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

01. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් කැඳවා, එම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම සිදු කරනු ලබයි.

02. තනතුරේ ස්වභාවය -
මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

03. වැටුප් පරිමාණය -
MN-02-2016, රු. 28,940 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660- රු. 47,990/-

04. මූලික සුදුසුකම් -
ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

05. තෝරා ගනු ලබන ක්‍රමය -
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ පටිපාටිය, පුරප්පාඩු පවතින කම්කරු විනිශ්වයාධිකාරයන්ගෙන් තොරතුරු හා ආදර්ශ අයදුම් පත්‍රය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ (www.moi.gov.lk) පළ කර ඇත.

06. ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රය දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

සියලුම අයදුම්පත් තමන් දනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු වේ.

07. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

08. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

2024 ජුනි මස 28 වැනි දින,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

අංකය...............
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

| භාෂා මාධ්‍යය | සිංහල | |
|---|---|---|
| | දෙමළ | |

**ආදර්ශ අයදුම්පත්‍රය**

*අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය*

*කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා වන අයදුම්පත්‍රය*

01. (අ) මුලකුරු සමග නම ඃ (සිංහලෙන්/දෙමළෙන්) :————.

මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

04. ලිපි එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ස්ථිර ලිපිනයත් වෙනස් වේ නම් පමණක් සම්පූර්ණ කරන්න.)

05. දුරකථන අංකය ඃ පෞද්ගලික :————. කාර්යාලය :————.

06. විද්‍යුත් තැපැල් ලිපිනය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය ඃ | | | | | | | | | | | | |

08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

09. උපන් දිනය ඃ වර්ෂය :————. මාසය :————. දිනය :————.

10. ජාතිය :————.

11. විවාහක/අවිවාහක බව :————.

12. වර්තමාන සේවා ස්ථානය සහ තනතුර :
.....................................................................................................................
.....................................................................................................................

13. කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියට පත් වූ දිනය :————.

14. වෙනත් සුදුසුකම් (ලකුණු දීමේ පටිපාටියෙ හි දක්වා ඇති තොරතුරු අනුව සඳහන් කරන්න) ඃ
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................

15. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

[අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න.] ඔව් ☐ නැත. ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .................................................................................................
.................................................................................................................................

16. ඔබ සම්බන්ධව යම් නොවිසඳුනු විනය ක්‍රියාමාර්ගයක් පවතී ද?

[අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න.] ඔව් ☐ නැත. ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .................................................................................................
.................................................................................................................................

17. ඔබ සුදුසුකම් මත තෝරාගතහොත් අනුයුක්ත වීමට මනාපය පළ කරන කම්කරු විනිශ්චයාධිකාර 03 ක් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. .................................................................................................................................
2. .................................................................................................................................
3. .................................................................................................................................

(කම්කරු විනිශ්චයාධිකාර ලැයිස්තුව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කර ඇති අතර, ඔබ විසින් මනාපය පළ කරන ආයතනයක් සඳහා ම අනුයුක්ත කරන බවට සහතිකයක් ලෙස මෙය නොසැළකිය යුතු ය.)

18. අයදුම්කරුගේ සහතිකය ඃ

i. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ii. ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

iii. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

19. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ....../......./... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනවිය ....../....../...... දින සිට ................. ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, නිලධාරියා සම්බන්ධව නොවිසඳුනු විනය කටයුත්තක් ඇති/නැති බවත්, යම් විනය කටයුත්තක් ආරම්භ කිරීමට නියමිත/නියමිත නැති බවත්, අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, එම නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුව හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ ක්‍රමය

01. කාර්මික ආරවුල් පනත පිළිබඳ දැනුම - ලකුණු 10

02. ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම - ලකුණු 10

03. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : (- ලකුණු 40)

i. සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 10

- රජයේ පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා

  (එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05ක් සඳහා)

ii. පුහුණුවීම් - ලකුණු 10

- සමස්ථ සේවා කාලය තුළ ආයතන සංග්‍රහය - මුදල් රෙගුලාසි, මානව සම්පත් කළමනාකරණය, මහජන සම්බන්ධතා, වැටුප්, විනය, පෞද්ගලික ලිපිගොනු ආදිය හා රාජකාරි විෂය ක්ෂේත්‍ර ආවරණවන පරිදි ලබා ගෙන ඇති පුහුණුවීම් සඳහා
  (එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05 ක් සඳහා)

iii. ඉංග්‍රීසි දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහිතක පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
  - වෙනත් (ලකුණු 03)

  (ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදු වේ)

iv. පරිගණක දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
- වෙනත් (ලකුණු 03)

  (ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදුවේ.)

04. ජ්‍යෙෂ්ඨත්වය : ලකුණු 10

කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ සේවා කාලය සඳහා

- වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10 ක් සඳහා
- වසරකට අඩු හා මාස 06 කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.5
- මාස 06 කට අඩු හා මාස 03 කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.25

**සටහන** : මාස 03 කට අඩු කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

05. සේවා පළපුරුද්ද :

| | | |
|---|---|---|
| කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ හෝ කම්කරු විනිශ්චය සභාවක කළමනාකරණ සේවා නිලධාරී ලෙස සේවය කර තිබීම. (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10 ක් සඳහා) | ලකුණු 10 | ලකුණු 15 |
| ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ලෙස සේවය කිරීම (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 05 ක් සඳහා) | ලකුණු 05 | |

**සටහන** :

- සේවා පළපුරුද්ද සඳහා මාස 06 කට නොඅඩු හා වසරකට අඩු කාල සීමාවක් සඳහා වසරකට හිමි වන ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ. කෙසේ වුවද මාස 03 කට අඩු සේවා කාලයන් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
- සේවා පළපුරුද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන තොරතුරු අදාළ ආයතන වෙතින් නිකුත් කළ ලේඛන මගින් තහවුරු කළ යුතු ය.

06. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා :

| | | |
|---|---|---|
| සන්නිවේදන හැකියාව | (ලකුණු 05) | ලකුණු 15 |
| නායකත්වය | (ලකුණු 05) | |
| පෞරුෂත්වය | (ලකුණු 05) | |

එකතුව ලකුණු 100

2024.05.01 දිනට සහකාර ලේකම් තනතුර පුරප්පාඩුව පවතින කම්කරු විනිශ්චය සභාවන්

| කම්කරු විනිශ්චය සභා අංකය | ලිපිනය | පුරප්පාඩු ඇති වූ ආකාරය |
|---|---|---|
| 01 | අංක 95, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ - 08 | විශ්‍රාම යාම |
| 01/02 අතිරේක | අංක 428/11, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල | විශ්‍රාම යාම |
| 02 | අංක 95, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ - 08 | විශ්‍රාම යාම |
| 06 | උසාවි සංකීර්ණය, නව නගරය, රත්නපුර | විශ්‍රාම යාම |
| 13 | අංක 95, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ - 08 | විශ්‍රාම යාම |

| කම්කරු විනිශ්චය සභා අංකය | ලිපිනය | පුරප්පාඩු ඇති වූ ආකාරය |
|---|---|---|
| 19 | මහාධිකරණ භූමිය, අවිස්සාවේල්ල | විශ්‍රාම යාම |
| 21/අතිරේක | 04 වන මහල, අධිකරණ, සංකීර්ණය, මීගමුව | විශ්‍රාම යාම |
| 22 | උසාවි සංකීර්ණය, මඩකලපුව | ආරම්භයේ සිට පත් කර නැත |
| 24 | ශ්‍රී බෝධි පාර, ගම්පහ | විශ්‍රාම යාම |
| 25 | දිසා අධිකරණ භූමිය, පානදුර | විශ්‍රාම යාම |
| 30 | අධිකරණ සංකීර්ණය, නව නුවර පාර, කඩුවෙල | ස්ථාන මාරු යාම |
| 31 | අංක 668, මීගමු පාර, මාබෝල, වත්තල | විදේශ සේවයේ රැකියාවකට යාම |
| 34 | පැරණි මොරවක මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල, ගල්දොළ, කොටපොළ | ස්ථාන මාරු යාම |
| 36 | වැලිමඩ පාර, බණ්ඩාරවෙල | ස්ථාන මාරු යාම |
| 37 | ටී. වී. ධර්මලිංගම් සංස්කෘතික ශාලාව, දෙව්සිරිපුර තලවකැලේ | ස්ථාන මාරු යාම |
| 38 | නව අධිකරණ සංකීර්ණය, බේලි පාර, නාවලපිටිය | ස්ථාන මාරු යාම |
| 39 | පලාපත්වල, මාතලේ | ස්ථාන මාරු යාම |
| 40 | උසාවි සංකීර්ණය, නව නගරය, රත්නපුර (බලංගොඩ) | විශ්‍රාම යාම |
| 44 | උසාවි සංකීර්ණය, අම්පාර | ස්ථාන මාරු යාම |
| ත්‍රිකුණාමලය | උසාවි සංකීර්ණය, ත්‍රිකුණාමලය | ස්ථාන මාරු යාම |
| හම්බන්තොට | ඉදිරියේ දී ස්ථාපිත කිරීමට නියමිත ය | - |

කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම්

අනුමත තනතුරු සංඛ්‍යාව - 39

සිටින නිලධාරීන් සංඛ්‍යාව - 17

පුරප්පාඩු සංඛ්‍යාව - 22

* නව බඳවාගැනීම්වල දී අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීම සම්බන්ධව ද සලකා බලන බැවින් ඉහත පුරප්පාඩු පවතින ස්ථාන සුළු වශයෙන් වෙනස් විය හැක.

* මීට අමතරව ඉදිරියේ දී විවෘත කිරීමට අපේක්ෂිත හම්බන්තොට කම්කරු විනිශ්චය සභාව සඳහා ද සහකාර ලේකම් තනතුර සඳහා නිලධරයෙකු අනුයුක්ත කිරීමට අපේක්ෂා කරයි.

* අංක 01/02 අතිරේකය, බත්තරමුල්ල හි සහකාර ලේකම් එක් තනතුරක් ලෙස සලකා ඇත.

* අංක 06, රත්නපුර හා අංක 40, බලංගොඩ යන කම්කරු විනිශ්චය සභා 02 සඳහා එක් තනතුරක් ප්‍රමාණවත් බව දන්වා එවා ඇත.

* ඒ අනුව, 2024.05.01 දිනට කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුරෙ හි සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 20 ක් ලෙස සලකා ඇත.

07-365

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2024/2025

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 28/2016 අනුව සුදුසුකම් සපුරාලන උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන්ගෙන් ගුරු විද්‍යාලයන් හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙතෙක් විධිමත් පුහුණුව සම්පූර්ණ නොකළ ගුරුවරුන්/ගුරු සහායකවරුන්, චක්‍රලේඛ අංක 28/2016 අනුව සකසා ගත් අයදුම්පත් **2024 අගෝස්තු 30 දිනට ප්‍රථම** "අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

මෙම චක්‍රලේඛය, අයදුම්පත හා උපදෙස් පත්‍රිකාව අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් ද (www.moe.gov.lk) ඕනෑම කලාප අධ්‍යාපන කාර්යාලයකින් ද ලබා ගත හැකිය.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
අධ්‍යාපන ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

**ගුරු විද්‍යාලයන්හි 2024/2025 ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ඉල්ලුම් පත්‍රය**

1. මාධ්‍යය : ☐
2. ඉල්ලුම් කරන පාඨමාලාව : ☐
3. මුල් පත්වීමේ ලිපියට අනුව පාසලේ වැඩ භාරගත් දිනය ☐
4. මුල් පත්වීමේ ස්වභාවය, විෂය සහ ඔබ අයත් වන සේවය/ශ්‍රේණිය
   (a) මුල් පත්වීමේ ස්වභාවය :
      ශ්‍රී ලංකා ගුරු සේවය - 01
      ගුරු සහායක - 02
      පිරිවෙන් - 03 ☐
      පෞද්ගලික පාසල් ගුරු සේවය - 04
      වෙනත් (සඳහන් කරන්න) - 05

   (b) පත්වීම් විෂයය ☐

   (c) අයත් වන ශ්‍රේණිය ☐

5. ඔබ පාඨමාලාව සඳහා තෝරා ගන්නා ගුරු විද්‍යාලයේ නම (උපදෙස් පතේ අංක 2.3 බලන්න)
   1. ...............
   2. ...............

6. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු දෙවනුව ලියන්න.
උදා : PERERA, A. B.) :
Rev./Mr./Mrs./Ms. :————.

7. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :————.

8. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න)

පුරුෂ - 1 ස්ත්‍රී - 2 ☐

9. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

10. (අ) උපන් දිනය :————.

(ආ) 2024.08.30 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

11. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

12. ඊ-මේල් ලිපිනය (ඇත්නම්) :————.

13. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)
.......................................................................................................................
.......................................................................................................................

14. (1) වර්තමාන සේවා ස්ථානය, ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)
.......................................................................................................................
.......................................................................................................................
දිස්ත්‍රික්කය :..................... කලාපය :.....................

(2) සේවා ස්ථානයේ ස්වභාවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.) ☐
රජයේ පාසලකි - 01, වතු පාසලකි - 02, රජයේ අනුමත පිරිවෙනකි - 03
රජයේ අනුමත පෞද්ගලික පාසලකි - 04, වෙනත් - 05

15. අයදුම්කරුගේ ප්‍රකාශය :
මවිසින් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් දැනට වෙනස් ආයතනික පුහුණුවකට සහභාගි නොවන බවත් සහතික කරමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන

16. විදුහල්පතිවරයාගේ නිර්දේශය :
ඉහත අයදුම්කරු මෙම පාසලේ සේවයේ නියුතු අයෙක් බවත් ඔහු/ඇය ඉහත දක්වන තොරතුරු, සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

මෙම ගුරුවරයා, එකී ගුරු පුහුණුව සඳහා තෝරා ගන්නේ නම් ඔහු/ඇය ඒ සඳහා නිදහස් කිරීමට එකඟ වෙමි.

————,
දිනය :————. විදුහල්පතිගේ අත්සන සහ නිල මුද්‍රාව

17. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය ඃ

මෙම ගුරුවරයා, එකී ගුරු පුහුණුව සඳහා තෝරා ගන්නේ නම් ඔහු/ඇය ඒ සඳහා නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය :————.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
සහ නිලමුද්‍රාව

18. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය ඃ

මෙම ගුරුවරයා, එකී ගුරු පුහුණුව සඳහා තෝරා ගන්නේ නම් ඔහු/ඇය ඒ සඳහා නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය :————.

————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
සහ නිල මුද්‍රාව

*අධ්‍යාපන අමාත්‍යාංශය*

*ගුරු විද්‍යාලවල 2024/2025 ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම*
*අයදුම්පත පිරවීම සඳහා අවශ්‍ය උපදෙස්*

01. ගුරු විද්‍යාලවල දෑ අවුරුදු ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ විසින් නිකුත් කළ විධිමත් පත්වීම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන් හා ගුරු සහායකයින්,

1.2. අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික පාසල්වල සිටින රජයේ අනුමත පත්වීම් ලබා ඇති ගුරුවරුන්,

1.3. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති පිරිවෙන් ගුරුවරුන්,

1.4. මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ, ප්‍රින්සෙට්, ගුරු විදුහල් පැරණි නිර්දේශය, උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ ගුරු පුහුණු පාඨමාලාව හදාරා අසාර්ථක වූ බව අදාළ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්,

02. විශේෂ උපදෙස් ඃ

2.1 ගුරු විද්‍යාලවල පවතින පුරප්පාඩු මත හා පත්වීම පදනම් කර ගෙන තෝරා ගැනීම සිදු කෙරේ. ගුරු සේවයේ උසස්වීම්වලදී වෘත්තීය සුදුසුකම් නොමැතිවීම නිසා පාඩු සිදුවනවා පමණක් නොව පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය ඇති කරගැනීමට ද බාධාවක් වී ඇත. මෙම සියලු කරුණු සලකා සියලු ම උපාධිධාරි නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා දෑ අවුරුදු ගුරු පුහුණුව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

2.2 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොමැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ පෞද්ගලිකව නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

2.3 පාඨමාලා පැවැත්වීම සඳහා ඇති පහසුකම් අනුව පාඨමාලාව පැවැත්වෙන ගුරු විද්‍යාලය තීරණය වන බැවින් සැමවිට ම ආසන්න ගුරු විද්‍යාලය ලබා දීමට නොහැකි වේ. අයදුම්පතේ අංක 5 කොටස පිරවීම සඳහා ගුරු විද්‍යාලවල පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ පහත තොරතුරු උපයෝගී කරගන්න.

| | ගුරු විද්‍යාලය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බලපිටිය | උණවටුන | ගිරාගම | ගම්පොළ | කොටගල | අඩ්ඩාලච්චේන | කෝපායි | මඩකළපුව |
| මාධ්‍යය | සිංහල | සිංහල | සිංහල | සිංහල | දෙමළ | දෙමළ | දෙමළ | දෙමළ |
| විෂයය | ගෘහ ආර්ථික විද්‍යාව | ඉංග්‍රීසි | පළමු බස සිංහල | ඉංග්‍රීසි | ප්‍රාථමික අධ්‍යාපනය | ඉංග්‍රීසි | ඉංග්‍රීසි | ඉංග්‍රීසි |
| | හස්ත කර්මාන්තය හා තාක්ෂණය | ප්‍රාථමික අධ්‍යාපනය | නැටුම් | | දෙවන බස සිංහල | ශාරීරික අධ්‍යාපනය | ගණිතය | ප්‍රාථමික අධ්‍යාපනය |
| | ක්‍රිස්තු ධර්මය | විද්‍යාව | සංගීතය | | චිත්‍ර | ප්‍රාථමික අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපනය | සමාජ විද්‍යාව |
| | ශාරීරික අධ්‍යාපනය | දෙවන බස සිංහල | චිත්‍ර | | උපදේශනය | ඉස්ලාම් | වාණිජ | විද්‍යාව |
| | විශේෂ අධ්‍යාපනය | ගණිතය | බුද්ධ ධර්මය | | කෘෂිවිද්‍යාව | තොරතුරු තාක්ෂණය (ඉංග්‍රීසි) | ප්‍රාථමික අධ්‍යාපනය | පළමු බස දෙමළ |
| | ප්‍රාථමික අධ්‍යාපනය | තොරතුරු තාක්ෂණය (ඉංග්‍රීසි) | | | හින්දු ධර්මය | | සංගීතය | ක්‍රිස්තු ධර්මය |
| | සමාජ විද්‍යාව | කෘෂි විද්‍යාව | | | නැටුම් | | පුස්තකාල විද්‍යාව | දෙවන බස දෙමළ |
| | පුස්තකාල විද්‍යාව | වාණිජ | | | දෙමළ | | හස්ත කර්මාන්තය හා තාක්ෂණය | |
| | උපදේශනය | | | | | | ගෘහ ආර්ථික විද්‍යාව | |
| | | | | | | | | |

(එක් විෂයයකට අයදුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව මෙම පාඨමාලා පවත්වන ගුරු විද්‍යාල වෙනස් විය හැකි බව සලකන්න.)

2.4 ගුරු විද්‍යාලයෙ හි පුහුණු කාලය තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ වෙනත් බාහිර විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය. ඒ පිළිබඳ ලැබෙන තොරතුරු අනුව පාඨමාලා හැරයාම පිළිබඳව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

2.5 යම් අයෙකු ගුරු විද්‍යාලයක ලියා පදිංචි වූ පසුව අදාළ පාඨමාලාව වෙනස් කිරීමට හෝ වෙනත් ගුරු විද්‍යාලයකට මාරුවීම සඳහා ඉල්ලීම් කළ නොහැකිය.

2.6 මෙම පාඨමාලාව පහත දැක්වෙන ගුරුවරුන්ට අදාළ නොවේ.

(අ) කවර හෝ ගුරු විද්‍යාලයක දැනටමත් පුහුණුව ලබන්නා වූ හෝ පුහුණුව ලබා ඇති ගුරුවරුන්,

(ආ) උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරී කළමනාකරණ සහායක පත්වීම් හෝ ඒ සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන්,

(ඇ) මෙහි අංක 1 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන්,

2.7 සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපදිංචි වීමට කැඳවන දිනයේ දී භාරදිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 05ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත.

2.8 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරුපත්වීම් ලැබ පුහුණුවට ඇතුළත්වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල් පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත්වන බව සැලකිය යුතු ය. ගුරු පුහුණුව සම්පූර්ණ කළ පසු තමා සේවය කළ පාසලට හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන පුරප්පාඩු සහිත වෙනත් පාසලකට නැවත වාර්තා කළ යුතුය. පත්වීමේ ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.

2.9 ගුරු පුහුණු පාඨමාලා සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත් වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වීම සඳහා විශේෂ අනුමැතියක් ලබාගත යුතු අතර අදාළ ගුරු සිසුවාගෙන් රජයේ වියදම් තක්සේරු කර අධිභාරය සමඟ අයකරනු ලැබේ.

2.10 යම් ආකාරයකින් සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැනගැනීමට ලැබුණු අවස්ථාවක පුහුණුවන කාලය තුළ දී නම් පුහුණුව අවලංගු කරන අතර පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

03. (i) ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම, සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය නීතිමාලාවට අනුකූල නොවන බව වැටහේ නම් හෝ ඉගෙනීම පිළිබඳ උද්යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් හෝ පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයකුගේ පාඨමාලාවට සහභාගී වීම සහ පැමිණීම 80% ට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(ii) නිවාඩු :

(අ) ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්ම විය යුතු ය.

(ආ) අධික ලෙස නිවාඩු ගැනීම හේතුවෙන් පාඨමාලාවේ අධ්‍යයන කටයුතු කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියකු පිළිබඳ ව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

04. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

05. වැටුප් පරිමාණය :

ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළ ව පසුකාලීන සංශෝධනවලට යටත් ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06.

(i) සෑම අයදුම්කරුවකු ම තමා පත්වීම් ලද විෂයයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන්ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ට ද ඉල්ලුම් කළ හැකි ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂයය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවල දී තමා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන්ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට විදුහල්පති

විසින් අනුමත කාලසටහනෙ හි පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාලසටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) පුහුණුව ලබාදෙන පාඨමාලා පහත පරිදි වේ.

| | පාඨමාලාවේ අංකය | පාඨමාලාවේ නම |
|---|---|---|
| i. | 01 | සිංහල |
| ii. | 02 | ප්‍රාථමික අධ්‍යාපනය |
| iii. | 03 | සමාජ විද්‍යාව |
| iv. | 04 | විද්‍යාව |
| v. | 05 | ගණිතය |
| vi. | 06 | කෘෂි විද්‍යාව |
| vii. | 07 | ගෘහ විද්‍යාව |
| viii. | 08 | ඉංග්‍රීසි |
| ix. | 09 | බුද්ධ ධර්මය |
| x. | 10 | ක්‍රිස්තියානි / රෝමානු කතෝලික ධර්මය |
| xi. | 11 | හින්දු ධර්මය |
| xii. | 12 | ඉස්ලාම් ධර්මය |
| xiii. | 13 | චිත්‍ර කර්මය |
| xiv. | 14 | සංගීතය |
| xv. | 15 | නැටුම් |
| xvi. | 16 | අරාබි |
| xvii. | 17 | විශේෂ අධ්‍යාපනය |
| xviii. | 18 | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| xix. | 19 | වාණිජ |
| xx. | 20 | දෙමළ |
| xxi. | 21 | ශාරීරික අධ්‍යාපනය |
| xxii. | 22 | දෙවන බස (සිංහල / දෙමළ) |
| xxiii. | 23 | තොරතුරු තාක්ෂණය |
| xxiv. | 24 | උපදේශනය |
| xxv. | 25 | පුස්තකාල විද්‍යාව |

07. යෝග්‍යතා :

7.1 සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

I. යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

II. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

III. සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතු ය.

08. රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20ක් ඉගැන්වීම් කරන ගුරුභවතුන් අතරින් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

8.1 මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල්, පෞද්ගලික පාසල් වශයෙන් සලකනු ලැබේ.

I. 1951 වර්ෂයේ දී ගාස්තුඅය කිරීමේ පාසල් බවට පත්වූ උපකෘත පාසල්,
II. 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ පාසල්
III. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ.) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්

8.2 පෞද්ගලික පාසල්වල ගුරුවරු ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරුභවතා අනුමත ගුරු මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

8.3 පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරුභවතුන්ට 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත හෝ යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

8.4 දැනට පිරිවෙන්වලින් ඉදිරිපත්වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවලට පමණි. (පත්වීම් ලද විෂයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන්වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතර ව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂි විද්‍යාව යන පාඨමාලා සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

8.5 සියලු ම රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමනාකරුගෙන් ද පිරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීගෙන් ද පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

I. පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,
II. පුහුණුවන කාලය තුළ ගුරුභවතාට වැටුප් ගෙවන බවට,
III. පුහුණුව අවසානයේදී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,
IV. පුහුණුව සඳහා තෝරා ගන්නා පිරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ/ඇයගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට,

8.6 රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතු ය.

8.7 රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවු. 18ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිටය. වෙනත් නිලධාරියෙකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතු ය.

09. ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම් කිරීම :

9.1 මෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමඟින් ඉල්ලුම් කළ යුතු ය.

(අ) ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

(ආ) ආකෘති පත්‍රය 8" X 12" ( A 4) කඩදාසියක දෙපැත්තේ පිළියෙල කළ යුතු ය.

(ඇ) කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතු ය.

9.2 අයදුම්කරු විසින් අයදුම්පත අඩුපාඩු රහිතව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) සෑම අයදුම්කරුවකු ම තම නම පත්වීම් ලිපියේ දැක්වෙන පරිදි සඳහන් කළ යුතුය.

(ආ) සෑම අයදුම්කරුවකු ම තම අයදුම්පත එවීමේ දී පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවීමට කටයුතු කළ යුතුය.

අ. පත්වීමේ ලිපිය;
ආ. ජාතික හැඳුනුම්පත;
ඇ. මුල්පත්වීමේ ලිපිය අනුව වැඩ භාරගත් පළමු දිනය සනාථ කිරීම සඳහා විදුහල්පති සහතික කරන ලද නිලමුද්‍රාව සහිත ලොග් සටහනේ පිටපතක්;

ඇ. අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ය;

ඉ. ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ඇත්නම් ඒ බව සනාථ කරන ලියකිලිවිලි.

(ඇ) අයදුම්පත තම පාසලේ විදුහල්පති මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) දක්වා ඇති උපදෙස් පරිදි පිළියෙල කරන ලද සියලු ම අයදුම්පත්‍ර පහත දක්වා ඇති ආකෘතියේ පරිදි සකස් කරන ලද ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙලවරේ "ගුරු විද්‍යාලවල ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2024/2025" ලෙස ද පාඨමාලාව, මාධ්‍යය සහ කලාපය ද සඳහන් කර 2024/08/30 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය.

අයදුම්පතක් හෝ ඒ සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අයදුම්පත් එවීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම දරාගත යුතුය.

ලියාපදිංචි තැපෑල

"ගුරු විද්‍යාලවල ගුරු අධ්‍යාපන
පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන්
තෝරා ගැනීම - 2024/2025"

පාඨමාලාවේ නම :............
මාධ්‍යය :............
කලාපය :............

අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

(ඉ) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,

i. අයදුම්පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ.

ii. ගුරු විද්‍යාලයට කැඳවීමේදී දී සියලු ම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිය යුතු ය.

10. "ගුරු විද්‍යාලවල ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2024/2025" යනුවෙන් ලියුම් කවරය වම්පස ඉහළ කෙලවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

11. මෙම නිවේදනයෙහි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

07-371

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

**මානව සම්පත් සංවර්ධනය සහ පොදු කාර්යාලීය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024 (ප්‍රධාන බඳවා ගැනීම)**

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර අධ්‍යයන සහ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක මානව සම්පත් සංවර්ධනය සහ පොදු කාර්යාලීය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා පිළිගත් වෘත්තීය මානව සම්පත් කළමනාකරුවෙකු වීමට හෝ මානව සම්පත් සංවර්ධන නිලධාරියෙකු වීමට හෝ එම ක්ෂේත්‍රයේ ඉහළ තනතුරු සඳහා අවශ්‍ය වෘත්තීය අධ්‍යාපන සුදුසුකම බලාපොරොත්තු වන රාජ්‍ය සහ පෞද්ගලික නිලධාරීන්ට පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකි ය.

**සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S3 සාමාර්ථය සහිතව සමත් වීම සහ
2024.06.30 දිනට වයස 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

**පාඨමාලාවේ ස්වභාවය :**

මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය).

**මාධ්‍යය :**

සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය :**

එක් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :**

මුළු පාඨමාලා ගාස්තුව රු. 36,900.00 කි.

පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 900.00 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.

රු. 36,000.00ක මුදල එකවර හෝ රු. 3,000.00 බැගින් දොළොස් මාසිකව ගෙවිය හැකි ය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරු විසින්,

1. අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සත්‍ය ඡායාපිටපත,
2. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපය (මාර්ගගත ශිෂ්‍ය හැඳුනුම්පත සැකසීම සඳහා),

070 - 550 8778 (**WhatsApp**) අංකයට යොමු කළ යුතු ය.

**පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : 2024 ජූලි මස 31 වේ.**

**වැඩි විස්තර සඳහා :** කාර්යාලීය වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 037-3170999 දුරකථන අංකය හරහා විමසිය හැකි ය.

ලේඛකාධිකාරී - ව්‍යාපාර අධ්‍යයන සහ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

07 - 432

**ඉඩම් මැනුම් සභාව**

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව, ඉඩම් මැනුම් සහ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හැසිරීම නියාමනය කිරීම සඳහා 2002 අංක 17 දරන මැනුම් පනත මගින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉඩම් මැනුම් සභාව සතු ප්‍රධාන රාජකාරීන් වන්නේ මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට අදාළ පැමිණිලි විභාග කිරීම යනාදිය වේ.

පහත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීමට සභාව අපේක්ෂා කරයි.

**කළමනාකරණ සහකාර III ශ්‍රේණිය - පුරප්පාඩු 03.**

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී,
(i) සිංහල/ දෙමළ
(ii) ගණිතය
යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිත ව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

(ඇ). පරිගණක භාවිතය පිළිබඳව මාස හයකට (06) නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

වයස : අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි අය විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම, භාෂා ප්‍රවීණතාව සහ පරිගණක පරීක්ෂණය යන විෂයයන් තුනෙන් ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

මාසික වැටුප් පරිමාණය :

(MA-1-1) - රු. 27,910 - 10x300 - 7x350 - 4x495 - 20x660 - රු. 48,540

වෙනත් ප්‍රතිලාභ :

1. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම්
2. ආපදා ණය
3. උත්සව අත්තිකාරම්
4. රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ සමාන තත්ත්වයේ අර්ධ රාජ්‍ය ආයතන විසින් භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය :

www.landsurveycouncil.org වෙබ් අඩවියේ පළකර ඇති මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අයදුම්කරු විසින් ඉදිරිපත් කළ විස්තර සහිතව PDF ආකෘතියේ අයදුම්පත්‍රයක් ලබාගත හැක.

**අයදුම්පත්‍ර යොමුකරන ආකාරය :**

එසේ ලබාගන්නා අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත සහතික කර, අධ්‍යාපන සහතිකපත්‍රවල පිටපත් සහ ලංකා බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ "සභාපති, ඉඩම් මැනුම් සභාව"නමින් ඇති අංක 0001658239 දරන ගිණුමට රු. 1,200/- ක විභාග ගාස්තු බැරකර ලබාගත් ලදුපත සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2024.08.12 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය. (මෙම ගාස්තුව කිසිලෙසකවත් නැවත ගෙවනු නොලබන බව කාරුණිකව සලකන්න) අයදුම්පත්‍රය බහා එවනු ලබන **ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි** "කළමණාකරණ සහකාර තනතුර සඳහා" යනුවෙන් සඳහන් කළ යුතු ය.

සභාපති,
ඉඩම් මැනුම් සභාව.

සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක 150, බර්නාර්ඩ් සොයිසා මාවත,
කොළඹ 05.

07 - 378

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2021/2022/2023**

අංක 1930/12 හා 2015.09.01 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට සීමිත පදනම යටතේ උසස් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2024 නොවැම්බර් මස කොළඹ දී** පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙත බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exam/E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 ජූලි මස 15 වැනි දින පෙ. ව. 9.00 ට විවෘත වන අතර 2024 අගෝස්තු මස 15 වැනි දින රාත්‍රී 9.00** ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ද, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් ඔවුන් සේවය කරන පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මඟින් ද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. 2021.12.31 දිනට හෝ 2022.12.31 දිනට හෝ 2023.12.31 දිනට

*හෝ*

ඉහත කිනම් හෝ දින දෙකකට

*හෝ*

ඉහත දින තුනට ම

*හෝ*

i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (5) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක පහම (5) උපයාගෙන ඇති,

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති,

iii. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති, නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

03. විශේෂ ශ්‍රේණියේ නිලධරයන් සඳහා පහත වැටුප් ක්‍රමය බලපැවැත්වේ.

(MN-7-2016 4 පියවර) රු. 43,845-8 x 755 - 18 x 1030 - රු. 68,425/-

04. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ.

i. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| | |
|---|---|
| සීමිත | 40% |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 60% |

ii. අනුමත තනතුරු සංඛ්‍යාව 04 ක් වනවිට සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වනවිට ඉහත සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.

iii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව 04 කට වැඩි නම්, ඉහත ඡේද අංක 04. i හි සඳහන් ප්‍රතිශතයන්ට යටත් ව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුය.

iv. රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදාළ සෙසු අවශ්‍යතා ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතා අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාග පැවැත්වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

v. පුරප්පාඩු පිරවීමේ දී ප්‍රතිඵල එක් එක් වර්ෂවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට අදාළ කර ගනු ලැබේ. එහි දී ඒ ඒ වර්ෂවල පැවති පුරප්පාඩු ඇති වූ දිනයන්ට සුදුසුකම් ලැබූ නිලධරයන් ලකුණු අනුපිළිවෙළ අනුව තෝරාගනු ලබන අතර විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය පැවැත්වූ දිනය වේ.

vi. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ 2021, 2022 සහ 2023 වර්ෂවල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

vii. මෙම විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා සහ 2022.01.01 දින සිට 2022.12.31 දක්වා සහ 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

05. අනන්‍යතාව සනාථ කිරීම :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

අ) ජාතික හැඳුනුම්පත

ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. අයදුම්පත් :

i. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරුවන් විසින් මාර්ගගතව සිදු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

ii. අයදුම්කරුවන්ට තම අයදුම්පතේ සඳහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන් ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන් ම විභාගය පවත්වනු ලබන අතර, අයදුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතු වේ.

iii. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිඳු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

- ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
- අන්තර්ජාල ගෙවීමේ පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
- ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
- ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of Bank of Ceylon)

*සටහන:-*

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

i. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයත්වන රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේම අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ii. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

iii. අයදුම්පතේ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දිනයේ දී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. ඉහත (07) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

09. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :

මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. විභාග පරිපාටිය :

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඔබ අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

(1) අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 1 කි. - ලකුණු 100 යි.
(2) කළමනාකරණය - කාලය පැය 3 කි. - ලකුණු 100 යි.

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

පළමු වන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.

**අභියෝග්‍යතා පරීක්ෂණය - විෂය අංකය (1)**

තමා වෙත පැවරෙන කාර්යන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.

**කළමනාකරණය - විෂය අංකය (2)**

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිත
- සැලසුම් කිරීම
- තීරණ ගැනීම
- තීරණ ගැනීමේ ක්‍රියාවලිය
- සංවිධානය
- මාණ්ඩලීකරණය
- මෙහෙයවීම
- අභිප්‍රේරණ ක්‍රියාවලිය
- නායකත්වය
- පාලනය
- පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය

(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

11. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. මෙම නිවේදනයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම විභාග නිවේදනයේ විවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
නියෝගය පරිදි,

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2024 ජූලි මස 04 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්
පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

07 - 380

---

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

අධ්‍යාපන අමාත්‍යාංශය

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

***ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2024 වර්ෂය***

2024 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) වයස : 2024.08.04 වැනි දිනට අවුරුදු 16ත් 22ත් අතර විය යුතු ය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම,

*හෝ*

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම.

**විශේෂ කුසලතා :**
විදුලි/ විද්‍යුත්/ යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ

තරඟ වලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන් ඉහත (ආ) සුදුසුකම් දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

(ඇ) *සැ. යු.*- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ වසර 03ක් හෝ වැඩි කාලයකට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතු ය.

**පාඨමාලා මාධ්‍යය :**
මෙහි දැක්වෙන සියළුම පාඨමාලා සිංහල මාධයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ.

සෛද්ධාන්තික දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ.

**ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය :**
අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(අ) විභාගය පවත්වන මාධ්‍යය : සිංහල/ දෙමළ

(ආ) විභාග මධ්‍යස්ථාන : කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ කිලිනොච්චිය (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.)

විභාගට අදාළ විෂයයන් :

ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතවන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීකෂණය, කාර්මික දැනුම, කාර්මික ඇඳීම සහ ඉංග්‍රීසි භාෂා දැනුම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

**විභාග ගාස්තු :**
අයදුම්පතෙහි සඳහන් ක්‍රමවේදයට අනුව විභාග ගාස්තු වශයෙන් රු. 1,000/- ක මුදලක් ගෙවිය යුතු ය. මෙම ක්‍රමවේදය හරහා හැර වෙනත් කිසිඳු ක්‍රමයකට ගෙවන ලද විභාග ගාස්තු පිළිගනු නොලැබේ.

ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**මූලික තෝරාගැනීම :**

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

අවසන් තෝරා ගැනීම :

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණ සඳහා 40% ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙ හි විශේෂ සැලකිල්ලක් දක්වනුලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත් ව පුහුණු පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතු ය.

පුහුණු පාඨමාලා :

| *අනු. අංකය* | *පාඨමාලාව* | *කාලසීමාව (අවුරුදු)* |
|---|---|---|
| 01 | මෝටර් රථ තාක්ෂණ ශිල්පී<br>Automobile Technician | 04 |
| 02 | මිල්රයිට් තාක්ෂණ ශිල්පී<br>Millwright Technician | 04 |
| 03 | වායු සමීකරණ සහ ශීතකරණ තාක්ෂණ ශිල්පී<br>Refrigiration & Air Conditioning Technician | 03 1/2 |
| 04 | බල විදුලි තාක්ෂණ ශිල්පී (කර්මාන්ත)<br>Power Electrical Technician (Industrial) | 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පී<br>Machinist Technician | 03 1/2 |
| 06 | කර්මාන්තගත මෙකාට්‍රොනික් තාක්ෂණ ශිල්පී<br>Industrial Mechatronics Technician | 03 1/2 |
| 07 | ඩීසල් කාර්මික ශිල්පී<br>Diesel Mechanic | 03 |
| 08 | වාහන විදුලි ශිල්පී<br>Automobile Electrical | 03 |
| 09 | පෑස්සුම් ශිල්පී<br>Welder | 03 |
| 10 | මෝටර් වාහන බොඩි අලුත්වැඩියා හා පින්තාරු ශිල්පී<br>Motor Vehicle Body Repairer & Painter | 03 |

අයදුම්කරුගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව උක්ත පාඨමාලා සඳහා අයදුම් කළ යුතු ය.

8. ගිවිසුම් අත්සන් කිරීම :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළ ව අවු. 03, 03 1/2, 04 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සමග ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතු ය.

9. අයදුම් කිරීම සඳහා උපදෙස් :

සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදු කළ යුත්තේ මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ පමණක් වේ.

මාර්ගගත ක්‍රමය (Online System ) ඔස්සේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදුකළ යුතු වන අතර අදාළ මාර්ගගත ක්‍රමය (Online System ) සඳහා පිවිසීමට පහත සඳහන් සබැඳියා භාවිතා කළ යුතු වේ.

https://germantec.lk/index.php/register-now/

තාක්ෂණික විමසීම් - 0701640650 - රුචිර රණසිංහ මහතා

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීමට පෙර අදළ සබැඳියෙ හි දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් අයදුම් කිරීම සිදුකළ යුතු ය.

ඉහත ලබා දී ඇති උපදෙස් පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් අයදුම්කරු පත්වන අපහසුතාවය පිළිබඳව ආයතනය කිසිදු වගකීමක් දරනු නොලබන අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කූට හෝ වංචනික බවට හෙළිවුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන් ඉවත් කරන ලබන අතර මින් ඉදිරියට ආයතනයේ විභාග සඳහා ද නුසුදුස්සෙකු වනු ඇත.

වැඩිදුර විස්තර සඳහා www.germantec.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :

අංක 09 හි ඇති සබැඳියෙ හි (link) දක්වා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරමි. **2024.08.04** දින හෝ එදිනට පෙර මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීම සම්පූර්ණ කළ යුතු ය.

11. විභාග ප්‍රවේශපත්‍ර :

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර **2024.08.26** දින වනවිට ලැබීමට සලස්වන අතර ඒ වන විටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 03ක් ඇතුළත පහත දුරකථන අංකයෙන් විමසිය යුතු ය.

කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,
අංක. 582, ගාලු පාර, ගල්කිස්ස.
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංක - 0112605625/ 0112605535

07 - 577

---

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

## රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

## ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2024 වර්ෂය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.**

---

- **පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ මාස දෙකක පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක් ව පවතින ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. මාස 2ක පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් පුහුණු රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

- **මයික්‍රොසොෆ්ට් ඔෆීස් සහ මූලික ග්‍රැෆික්ස් සිද්ධාන්ත - Microsoft Office with Essential Graphics**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, MS Office ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳ දැනුමක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දෙන අතර මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන් හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

- **පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 25,000 NVQ IV සහතිකපත් පාඨමාලාව රු. 45,000

- **පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

- **වෙබ් අඩවි නිර්මාණකරණ උසස් පාඨමාලාව - Advanced Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

- **පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ඵලදායී පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000
NVQ පාඨමාලාව : රු. 65,000

- **අරේඛීය සංස්කරණ උසස් පාඨමාලාව - Advanced Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

- **ත්‍රිමාණ සජීවීකරණ උසස් පාඨමාලාව - Advanced 3D Modelling and Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

- **පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. මෙම පාඨමාලාවේ විශේෂත්වය වන්නේ Laptop අලුත්වැඩියාව පිළිබඳව පුහුණුව ද ලබා දේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන් ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
  **Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණයවන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනයවන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 70,000

- **වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාට ම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,000

- **ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්‍ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්‍ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

- **ඩිජිටල් මුද්‍රණ තාක්‍ෂණය හා සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්‍ෂණය පිළිබඳ ද්විත්ව පුහුණු පාඨමාලාව**

**Training Programme in Digital Printing Technology and Multi Colour Offset Printing Technology**

මෙම පාඨමාලාව තුළින් නවතම ඩිජිටල් මුද්‍රණ තාක්‍ෂණය සහ සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්‍ෂණය පිළිබඳ නවීනතම යන්ත්‍ර ආශ්‍රයෙන් පුහුණු කරනු ලැබේ. විදේශ රැකියා අපේක්ෂිත තරුණයන් සඳහා ම මෙම පාඨමාලාව විශේෂයෙන් ම සැකසී ඇත.

සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් මෙම පුහුණු පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස් කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන : 011 2686162, 011 2679791, 071 9716655, 071 6432943**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.**
**දුරකතන අංක : 066 2222172, 071 0554298.**

07 - 000

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.